## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**<u>රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ සමුළු නිල නිවාස ලබා දීමට සුදුසු විධායක නිලධාරීන් තෝරාගැනීම - 2024 වර්ෂය සඳහා පමණි.</u>**

රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ සමුළු නිවාස ලබා ගැනීමට බලාපොරොත්තු වන විධායක ශ්‍රේණියේ නිලධාරීන් මෙම නිවේදනයේ දැක්වෙන උපදෙස් අනුව මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කර 2024.03.22 දින වනවිට ඉදිරිපත් කළ යුතු වේ. තවද එලෙස සම්පූර්ණ කර බාගත කරනු ලැබූ අයදුම්පත්‍රය, ආයතන ප්‍රධානියා ගේ තහවුරුව මෙන්ම ඉදිරිපත් කිරීමට අවශ්‍ය බව සඳහන් කර ඇති සෙසු තහවුරු කිරීමේ ලේඛනද සමඟ පරිලෝකනය (scan) කර තනි ලේඛනයක් (PDF file) ලෙස ගොනුගත කර 2024.03.28 දින හෝ එදිනට ප්‍රථම රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශයේ නිවාස හා සංවර්ධන අංශය වෙත pubadsummit2024@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු වේ.

**<u>රජයේ සමුළු නිවාස සඳහා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීම පිලිබඳ විධිවිධාන හා උපදෙස් මාලාව</u>**

**1.0** රජයේ සමුළු නිල නිවාස සඳහා අයදුම්පත් කැඳවීම.

**1.1** අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර පහත සඳහන් කර ඇති විධිවිධාන හා තොරතුරු හොඳින් අධ්‍යයනය කළ යුතු ය.

**2.0 මූලික සුදුසුකම් :**

2.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථ නිරූපණය කර ඇති පරිදි රාජ්‍ය නිලධාරියෙකු වීම. එසේම, එම රාජ්‍ය නිලධාරියා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 (වැටුප් සංශෝධන) විධායක ශ්‍රේණියේ තනතුරක් දරන සක්‍රීය සේවයේ නියුතු රාජ්‍ය නිලධාරියෙකු ද විය යුතුය.

2.2 කොළඹ දිස්ත්‍රික්කය තුළ සේවා ස්ථානයක රාජකාරී කිරීම.

2.3 ඉල්ලුම්කරු හෝ ඉල්ලුම්කරුගේ කලත්‍රයා මින් පෙර රජයේ සමුළු නිවාස හිමිකම භුක්තිවිඳ නොතිබීම.

2.4 ඉල්ලුම්කරන අවස්ථාවේදී ඉල්ලුම්කරු හෝ ඉල්ලුම්කරුගේ කලත්‍රයාගේ නමින් වෙන්කරන ලද රජයේ නිල නිවසක් නොතිබීම.

2.5 ඉල්ලුම්කරු හෝ ඉල්ලුම්කරුගේ කලත්‍රයා යන දෙදෙනාම රජයේ සේවකයන් වන විට නිවාස ඉල්ලුම් කල හැක්කේ එක් අයෙකුට පමණි.

2.6 සේවා ස්ථානයේ සිට ස්ථිර පදිංචි ස්ථානයට (ඡන්ද හිමි ලියාපදිංචි තොරතුරු අනුව) ගූගල් සිතියම (Google map) ආශ්‍රයෙන් මැනීම් සිදුකර ලබා ගනු ලබන අහස් දුර 20kmට වඩා වැඩිවීම.

2.7 නිවාස ඉල්ලුම් කරනු ලබන ඉල්ලුම්කරුගේ සේවා ස්ථානය අයත් දෙපාර්තමේන්තුව හෝ අමාත්‍යාංශය සතුව රජයේ නිල නිවාස යෝජනා ක්‍රම නොපැවතිය යුතුය.

2.8 2024.03.01 දින වන විට රජයේ ඕනෑම නිල නිවසකට අදාළව හිඟ නිවාස කුලී නොපැවතීම.

2.9 1985 අංක 45, 1981 අංක 08, 1974 අංක 40 සහ 1971 අංක 03 සංශෝධිත පනත් වලින් සංශෝධිත 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ අංක 3 වන වගන්තිය යටතේ නඩු චෝදනාවකට වරදකරුවෙකුව නොතිබීම.

2.10 ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛනවලින් එක් ලේඛනයක් හෝ ලේඛන කිහිපයක් අසත්‍ය, නීත්‍යානුකූල නොවන ලේඛනයක් හෝ ලේඛන බව තහවුරු වුවහොත්, එම හේතුව නිසා ම එකී අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.11 උක්ත 2.8 සඳහන් පරිදි සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමක් සිදුකර තිබේ නම්, අයදුම්කරු සහ එම සාවද්‍ය තොරතුරු සපයනු ලැබූ හෝ අනුබල දැක්වූ අනිකුත් සියලුම නිලධාරීන් පිළිබඳව පවතින නීති රෙගුලාසි යටතේ විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

**3.0 අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී සැලකිලිමත්විය යුතු කරුණු :**
**(අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු කරුණු)**

3.1 මාර්ගගත අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශ වෙබ් අඩවියේ නිවාස හා සංවර්ධන අංශයේ වෙබ් පිටුව වෙත පිවිස, https://forms.gle/9AABndiFJ7w8perm9 මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු වේ.

3.2 අයදුම්පත්‍ර යොමුකරනු ලබන දින වන විට (ඡන්ද හිමි ලියාපදිංචි තොරතුරු අනුව) පදිංචි නිවසේ සිට රැකියා ස්ථානයට අහස් දුර ගූගල් සිතියම (Google map) ආශ්‍රයෙන් මැනීම් සිදුකර අයදුම්පත්‍රයෙහි අංක 12 (iii) හි සටහන් කිරීම සිදුකළ යුතු වේ. ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම සේවා සහතිකය හා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට නියමිත අවසාන දිනට පෙර මාස 03ක කාලයේ අයදුම්කරුගේ හෝ කලත්‍රයාගේ නමට එම නිවසට අදාළ ජල, විදුලි සහ දුරකථන බිල් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. කලත්‍රයාගේ නමට එම බිල් පවතින්නේ නම්, විවාහ සහතිකය ද අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

3.3 අයදුම්කරු තමා දැනට සිටින විධායක ශ්‍රේණියේ පත්වීම ලබා ගත් පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කිරීම කළ යුතුය.

3.4 ඉල්ලුම්කරු හෝ කලත්‍රයා සේවා කාලය තුළ රජයේ නිල නිවාසයක වරප්‍රසාද (ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 1හි රජයේ නිවාස අර්ථ නිරූපණය කර ඇත.) ලබා ගෙන තිබේ නම්, ඒ පිළිබඳ අයදුම්පත්‍රයෙහි අංක 31 සහ 32 හි සටහන් කළ යුතු වේ.

3.5 ඉල්ලුම්කරු හට හෝ කලත්‍රයා හට කල්පවත්නා ආකාරයේ ඇවිදීම/ගමන් කිරීම අපහසුවන හෝ වෙනත් බරපතල ශාරීරික ආබාධයක් හෝ වෙනත් කල්පවත්නා බරපතල රෝගී තත්ත්වයක් පවතී නම් ඒ පිළිබඳවත්, ඉල්ලුම්කරු සමඟ ජීවත්වන දරුවන්/යැපෙන්නන් හට (වයස අවුරුදු 18ට අඩු දරුවන්) ඩවුන්ස් සහලක්ෂණය(Down's Syndrome)/ වකුගඩු රෝගාබාධ (Renal Failure)/ කොඳු ඇට පෙළේ ආබාධය (Spinal Cord Disorders)/ බරපතල ශාරීරික ආබාධ හෝ වෙනත් රෝගාබාධ පවතී නම්, ඒ පිළිබඳවත් අයදුම්පත්‍රයෙහි අංක 19 , 21(iv) සහ 22 (iii) හි සඳහන් කිරීමට අමතරව ආසන්න වසරක කාලයක් ඇතුලත

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙහි ලියාපදිංචි වෛද්‍යවරයකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය වාර්තාවක් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

**(ආයතන ප්‍රධානියා විසින් තහවුරු කර ඉදිරිපත් කළ යුතු කරුණු)**

3.6 අයදුම්පත් යොමු කරනු ලබන දිනට ආසන්න මාස 06ක කාලය තුළ අයදුම්කරුගේ තනතුරට අදාළව රාජකාරි ස්වභාවය, වගකීම හා කාර්යය සාධනය පිලිබඳව ආයතන ප්‍රධානියා විසින් ලබා දෙනු ලබන ලිඛිත තහවුරුවක් තිබීම අනිවාර්යය වේ. මෙම ලිඛිත තහවුරුව අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

3.7 උක්ත 3.5හි කරුණට අමතරව, පහත කරුණු පිළිබඳව ද වාර්තා කළ යුතු වේ.

i. රජයේ ඕනෑම නිල නිවසකට අදාළව හිඟ නිල නිවාස කුලී පවතී නම් ඒ පිලිබඳ තොරතුරු (අයදුම්පතේ 27)

ii. 1985 අංක 45, 1981 අංක 08, 1974 අංක 40 සහ 1971 අංක 03 සංශෝධිත පනත් වලින් සංශෝධිත 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ අංක 3 වන වගන්තිය යටතේ නඩු චෝදනාවකට වරදකරුවෙකු නම් ඒ පිලිබඳ තොරතුරු (අයදුම්පතේ 28)

iii. රාජ්‍ය සේවයට පැමිණීමෙන් පසු වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබේ නම් (වැටුප් රහිත ප්‍රසූත නිවාඩු හැර) ඒ පිලිබඳ තොරතුරු (අයදුම්පතේ 29)

iv. ඉල්ලුම්කරු රජයේ නිවාස වරප්‍රසාද ලබා ගෙන තිබේ නම් ඒ පිලිබඳ තොරතුරු (අයදුම්පතේ 31,32)

v. ඉල්ලුම්කරුගේ හෝ කලත්‍රයා සේවය කරන අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් නිවාස යෝජනා ක්‍රමයක් පවතීද යන්න පිලිබඳ තොරතුරු (අයදුම්පතේ 12.xi, 21.v)

උක්ත කරුණු සියල්ල ද පෞද්ගලික ලිපිගොනුවෙන් හෝ වෙනත් ලිඛිත ලියවිලි මඟින් පරීක්ෂා කර බලා ආයතන ප්‍රධානියා මඟින් සහතික කර අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

**4.0 අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියා පිළිවෙල :**

4.1 මාර්ගගත අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශ වෙබ් අඩවියේ නිවාස හා සංවර්ධන අංශයට අදාළ වෙබ් පිටුව වෙත පිවිස, https://forms.gle/9AABndiFJ7w8perm9 මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කර අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු කොටස් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, එම අයදුම්පත්‍රය බාගත කර ගැනීම සිදුකළ යුතු වේ.

4.2 එලෙස බාගත කරනු ලැබූ අයදුම්පත්‍රය පෞද්ගලික ලිපිගොනුව ඇසුරින් සම්පූර්ණ කළ යුතු කොටස් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ආයතන ප්‍රධානියා ගේ තහවුරුව (3.6 හා 3.7 පරිදි) මෙන්ම උක්ත 3.0 යටතේ ඉදිරිපත් කිරීමට අවශ්‍ය බව සඳහන් කර ඇති සෙසු ලේඛන සහ අනිකුත් තහවුරු කිරීමේ ලේඛනද සමඟ පරිලෝකනය (scan) කර තනි ලේඛනයක් (PDF file) ලෙස ගොනුගත කර 2024.03.28 දින හෝ එදිනට ප්‍රථම රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශයේ නිවාස හා සංවර්ධන අංශය වෙත pubadsummit2024@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කිරීමට කටයුතු කළයුතු වේ. එසේ අයදුම්කරු විසින් යොමු කරන විද්‍යුත් තැපැලෙහි ශීර්ෂය (Subject of The Email) ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් **අයදුම්කරුගේ මුලකුරු සමඟ නම _Summit** ලෙස සඳහන් කර එවීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතු වේ.
උදා: B.A.Perera_Summit

4.3 2024.03.28 වන දිනට පසුව ඉදිරිපත් වන ඉල්ලීම් කිසිදු හේතුවක් මත සලකා බලනු නොලැබේ.

**5.0 තෝරා ගැනීමේ ක්‍රමය:**

5.1 2024.03.28 වන දින හෝ එදිනට ප්‍රථම රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශය වෙත ලැබෙන සියලුම අයදුම්පත් නිල නිවාස කමිටුව මඟින් පරීක්ෂා කර, 6.0හි සඳහන් ලකුණු ක්‍රමයට අනුව ලකුණු ලබා දෙනු ලැබේ.

5.2 එම ලකුණු ලේඛනය 2024 වර්ෂයෙහි අප්‍රේල් මස 21 දින හෝ එදිනට ප්‍රථම රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශයේ නිල වෙබ් පිටුවේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

5.3 එලෙස රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ නිල වෙබ් පිටුවේ ප්‍රකාශයට පත්කරනු ලැබීමෙන් අනතුරුව, මෙහිදී ලකුණු ලබා දෙන බව සඳහන් කර ඇති නිර්ණායක සඳහා ලැබී ඇති ලකුණු පිළිබඳව සෑහීමකට පත් නොවන අයදුම්කරුවන් හට, එම ලකුණු ලැයිස්තුව ප්‍රකාශයට පත් කරනු ලබන දින සිට දින 10 ක් තුළ සභාපති, නිල නිවාස කමිටුව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට හැකියාවක් පවතී.

5.4 අභියාචනා සළකා බැලීමෙන් අනතුරුව 2024 වසර සඳහා රජයේ සමුළු නිවාස ලබාගැනීම සඳහා සුදුසුකම් සපුරන නිලධාරීන්ගේ ප්‍රමුඛතා ලේඛනය 2024.05.17 දින අමාත්‍යාංශයීය නිල වෙබ් පිටුවේ ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

5.5 ඉල්ලුම්කරු විසින් උක්ත 3.0හි සඳහන් සනාථ කිරීමේ ලේඛන අයදුම්පත්‍රය යොමුකරන අවස්ථාවේදීම ඉදිරිපත් නොකළහොත්, එම කරුණු සඳහා හිමිවීමට නියමිත ලකුණු අයදුම්කරුහට අහිමි වනු ඇත. එම ලේඛන අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් නොකර, ලකුණු අහිමිවීමෙන් පසුව අයදුම්කරු විසින් එම සනාථ කිරීමේ ලේඛන නිල නිවාස කමිටුව වෙත හෝ රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම් වෙත හෝ ඉදිරිපත් කර සිදුකරනු ලබන අභියාචනා කිසිවක් කිසිදු හේතුවක් මත සලකා බලනු නොලැබේ.

5.6 ඉහත 5.2, 5.3, 5.4 දක්වා ඇති දිනයන් කළමණාකරන හේතු මත වෙනස් විය හැක.

**6.0 තෝරා ගැනීම සඳහා උපයෝගී කර ගනු ලබන ලකුණු ලබා දීමේ ක්‍රමය :**

6.1 අයදුම්කරුවෙකු හට ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 50ක් වේ.

6.1.1. පහත සඳහන් නිර්ණායක සඳහා අයදුම්කරු හට ලකුණු එකතු වීම සිදුවේ.

i. ඉල්ලුම්කරු අයදුම්පත් යොමුකරනු ලබන දින වනවිට ඡන්ද හිමි ලියාපදිංචි තොරතුරු අනුව පදිංචි නිවසේ සිට රැකියා ස්ථානයට ගූගල් සිතියම (Google map) ආශ්‍රයෙන් මැනීම් සිදුකර ලබා ගනු ලබන අහස් දුර සඳහා පහත දැක්වෙන ආකාරයට ලකුණු ලබා දෙනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (a) | 21km සිට 40km තෙක් | - | ලකුණු 05 |
| (b) | 41km සිට 60km තෙක් | - | ලකුණු 10 |
| (c) | 61km සිට 80km තෙක් | - | ලකුණු 15 |
| (d) | 81km ට වැඩි | - | ලකුණු 20 |

(උපරිම ලකුණු 20)

ii. අයදුම්කරුගේ තනතුර අයත් වන ශ්‍රේණිය

(a) III වන ශ්‍රේණිය - ලකුණු 05

(b) II වන ශ්‍රේණිය - ලකුණු 05

(c) I වන ශ්‍රේණිය - ලකුණු 10

(d) විශේෂ ශ්‍රේණිය - ලකුණු 15

(උපරිම ලකුණු 15)

iii. ඉල්ලුම්කරු සමඟ ජීවත්වන දරුවන් (වයස අවුරුදු 18ට අඩු දරුවන්)/යැපෙන්නන් හට ඩවුන්ස් සහලක්ෂණය (Down's Syndrome)/ වකුගඩු රෝගාබාධ (Renal Failure)/ කොඳු ඇට පෙළේ ආබාධය (Spinal Cord Disorders)/ බරපතල ශාරීරික ආබාධ හෝ වෙනත් රෝගාබාධ පැවතීම/ ඉල්ලුම්කරු හට ඇවිදීම හෝ ගමන් කිරීම අපහසුවන අන්දමේ බරපතල ශාරීරික ආබාධයක් පැවතීම/ කලත්‍රයා හට බරපතල ශාරීරික ආබාධයක් පැවතීම (ඉහත කරුණු සම්බන්ධ වෛද්‍ය වාර්තා අයදුම්පත් යොමු කරන අවසන් දිනට මේ සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.)

(උපරිම ලකුණු 04)

iv. වයස අවුරුදු 18ට අඩු පුතුන් සහ අවිවාහක දියණියන් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. (උප්පැන්න සහතික සහ විවාහක අවිවාහක බව දිව්රුම් ප්‍රකාශ මඟින් තහවුරු කළ යුතුය.)

(උපරිම ලකුණු 03)

v. විවාහක අයදුම්කරුවන් සඳහා

(ලකුණු 08)

6.1.2. පහත සඳහන් නිර්ණායක සඳහා අයදුම්කරු හට ලකුණු අඩු වීම සිදුවේ.

i. 2024.03.22 දිනට රාජ්‍ය සේවයේ පූර්වාසන්න වසර 05 ක සේවා කාලයක් තුළ, ආයතන සංග්‍රහය හා අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්හි විධිවිධානවලට අනුකූල නොවන පරිදි වැටුප් රහිත නිවාඩු (වැටුප් රහිත ප්‍රසූත නිවාඩු හැර) ලබාගෙන ඇති නම්, එහිදී දින 05 කට වඩා අඩුවෙන් වැටුප් රහිත නිවාඩු ලබා ඇති නම් ලකුණු 05 ක්ද, දින 05 කට වඩා වැඩියෙන් වැටුප් රහිත නිවාඩු ලබා ඇති නම් ලකුණු 10 ක්ද අඩුකරනු ලැබේ.

(උපරිම සෘණ ලකුණු 10)

ii. 2024.03.22 දිනට පූර්වාසන්න වසර 05ක කාලයක් තුළ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ, කෝට්ටේ, දෙහිවල නාගරික සීමාවල පවතින රජයේ පොදු සේවා නිවාස වරප්‍රසාද ලබා ගෙන තිබේ නම් පහත දැක්වෙන ආකාරයට ලකුණු අඩුකරනු ලැබේ.

(a) අවුරුදු 01 තෙක් - ලකුණු 02

(b) අවුරුදු 01ට වැඩි - අවුරුදු 02 තෙක් - ලකුණු 04

(c) අවුරුදු 02ට වැඩි - අවුරුදු 03 තෙක් - ලකුණු 06

(d) අවුරුදු 03ට වැඩි - අවුරුදු 04 තෙක් - ලකුණු 08

(e) අවුරුදු 04ට වැඩි - අවුරුදු 05 ට අඩු - ලකුණු 10

(උපරිම සෘණ ලකුණු 10)

iii. ඉල්ලුම්කරුගේ කලත්‍රයාගේ නමින් 2024.03.22 දිනට පූර්වාසන්න වසර 05ක කාලයක් තුළ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ, කෝට්ටේ, දෙහිවල නාගරික සීමාවලත් පවතින රජයේ පොදු සේවා නිවාස වරප්‍රසාද ලබා ගෙන තිබේ නම් පහත දැක්වෙන ආකාරයට ලකුණු අඩුකරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (a) | අවුරුදු 01 තෙක් | - | ලකුණු 02 |
| (b) | අවුරුදු 01ට වැඩි - අවුරුදු 02 තෙක් | - | ලකුණු 04 |
| (c) | අවුරුදු 02ට වැඩි - අවුරුදු 03 තෙක් | - | ලකුණු 06 |
| (d) | අවුරුදු 03ට වැඩි - අවුරුදු 04 තෙක් | - | ලකුණු 08 |
| (e) | අවුරුදු 04ට වැඩි - අවුරුදු 05 ට අඩු | - | ලකුණු 10 |

(උපරිම සෘණ ලකුණු 10)

iv. අයදුම්පත යොමු කරනු ලබන අවස්ථාවේදී ප්‍රතිලාභ ලබන ආයතනයක (ප්‍රියමනාප සේවා ස්ථානයක) සේවය කරනු ලබන නිලධාරියකු වීම

(උපරිම සෘණ ලකුණු 10)

6.1.3. නිලධාරීන් කිහිපදෙනෙකුට එක සමාන ලකුණු ගණනක් ලැබෙන අවස්ථාවන්හිදී එම නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව අවසන් තීරණය ගනු ලැබේ.

6.2. මෙම ලකුණු ලබා දීමේ ක්‍රියාවලිය සිදුකර ඇත්තේ ආයතනය සංග්‍රහයේ දක්වා ඇති මාර්ගෝපදේශයන්ට සහ මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කාලසීමාව තුල කලින් කලට පනවන නීති රෙගුලාසි වලට අනුකූලවය.

7.0 **මෙම නිවේදනයේ සඳහන් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණය රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශ ලේකම් සතුය.**

**ලේකම්**
**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.**